**නවක විද්‍යාර්ථීන්ගේ (2022/2023)**

**පීඨ ලියා පදිංචිය හා අධ්‍යයන ලියා පදිංචිය සම්බන්ධ විශේෂ උපදෙස්**

2022/2023 නව අධ්‍යයන වර්ෂයට කැලණිය විශ්වවිද්‍යාලයේ කලා විෂය ධාරාව හැදෑරීම සඳහා හා ප්‍රවේශ වන සියලු විද්‍යාර්ථීන් මානවශාස්ත්‍ර පීඨයට හෝ සමාජයීය විද්‍යා පීඨයට ඇතුලත්ව අන්තර් පීඨ විෂයමාලා සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ (**ICCMS**) නියමිත කාල වකවානුව තුළ අනිවාර්යයෙන්ම අධ්‍යයන ලියා පදිංචිය ලබා ගත යුතුය.

**<u>පීඨ ලියාපදිංචිය සම්බන්ධ විශේෂ උපදෙස්</u>**

1. **ඉල්ලුම් පත්‍රය (පීඨ දෙකට ඇතුලත් කිරීම සඳහා)**

ප්‍රථම අදියරේ දි සියලු විද්‍යාර්ථීන් උසස් පෙළ හදාරා ඇති විෂයයන් හා ලබා ඇති ඉසෙඩ් අගය (Z-score) පදනම් කරගෙන විද්‍යාර්ථීන්ගේ කැමැත්ත අනවු පීඨ දෙකට වෙන් කරනු ලබයි. ඒ සඳහා සමාජයයී විද්‍යා පීඨය විසින් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කොට ඇත. එම පීඨයට අදාල සිසුන් තෝරා ගත් පසු ඉතිරි සියලු දෙනා මානවශාස්ත්‍ර පීඨයට ඇතුලත් වේ. තමන් ඇතුලත් වන පීඨයෙන් විෂය දෙකක් හෝ තුනක් තෝරාගත යුතු වන අතර තුන්වන විෂය අවශ්‍ය නම් අනිත් පීඨයෙන් තෝරා ගැනමට අවකාශ ඇත. පළමු වසරේ දී විෂයයන් දෙකක් හදාරණ පීඨයට අයත් වුවත් දෙවන වසරේ සිට තුන්වන විෂය ගෞරව උපාධි හැදෑරීමට තෝරා ගත් විට එම විද්‍යාර්ථියා එම විෂය අදාළ පීඨයට අයත් වේ.

**1.1.**

අ.පො.ස.(උපෙ) සමත් වූ විෂය/විෂයයන් පදනම් කරගෙන විද්‍යාර්ථියාගේ ඉල්ලීම පරිදි පළමුව පීඨවලට ඇතුලත් කරනු ලබයි. මෙහි දි පහත සඳහන් විෂයයන් සමත් වී තිබීම ඒ ඒ පීඨවලට ඇතුලත් වීම සඳහා සුදුසුකම් සේ සැලකේ.

**1.1.1** සමාජයීය විද්‍යා පීඨය සඳහා <u>සමාජයයී විද්‍යා/ව්‍යවහාරික සමාජ අධ්‍යයන</u> විෂයයන් යටතේ ඇති ආර්ථික විද්‍යාව/ භූගෝල විද්‍යාව /ඉතිහාසය/ගෘහ ආර්ථික විද්‍යාව / දේශපාලන විද්‍යාව/ තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය/ගිණුම් කරණය හෝ ව්‍යාපාර සංඛ්‍යානය/කෘෂි විද්‍යාව/ තාක්ෂණවේදය/ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය/ තොරතුරු හා සන්නිවෙදනය හා තාක්ෂණය යන විෂයයන් ඇතුලත් වේ.

**1.1.2 මානවශාස්ත්‍ර පීඨය සඳහා**

<u>ආගම් හා ශිෂ්ටාචාර</u> විෂයයන් යටතේ ඇති බුද්ධ ධර්මය හෝ බෞද්ධ ශිෂ්ටාචාරය/ ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය/හින්දු ධර්මය හෝ හින්දු ශිෂ්ටාචාරය/ ඉස්ලාම් ධර්මය හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය /ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය.

<u>සෞන්දර්ය විෂයයන්</u> යටතේ චිත්‍ර කලාව/නර්තය (දේශිය හෝ භරත නාට්‍ය) /සංගීතය (පෙරදිග, කර්ණාටක, බටහිර)/ නාට්‍ය හා රංග කලාව

<u>භාෂා විෂයයන්</u> යටතේ ඇති සිංහල / දෙමල / ඉංග්‍රීසි / අරාබි / පාලි / සංසක්ෘත / චීන / මැලේ /ප්‍රංශ/ ජර්මන් / රුසියන් / හිනදී /ජපන් යන විෂයයන් මෙයට ඇතුලත් වේ.

**1.2.**

ඉහත අංක 1.1. න්සුදුසුකම් නොලබන එහෙත් ඉහල ඉසෙඩ් අගයක් (Z-score) සහිත විද්‍යාර්ථීන්ට ඉසෙඩ් අගයේ ප්‍රමුඛත්වය අනුව තමන් කැමති පීඨයකට ඇතුලත් වීම සඳහා අදාළ පීඨයේ නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව සම්පූර්ණ වන තෙක් අවස්ථාව ලබා දී ඇත.

**1.3.**

ඔබ කැමති විෂයයන් හෝ පීඨය ඉහත ක්‍රම දෙක අනවු නොලැබුණි නම් ඔබට අභියාචනා කිරීමේ අවස්ථාවක් ඇත. ඒ අනුව තමන් දැනට ලැබී ඇති පීඨයේ අදාළ විෂයයන්ට ලියාපදිංචි වීමෙන් පසු තමන්ගේ කැමැත්ත සඳහන් කොට අභියාචනයක් ***iccms*** වෙත විද්‍යුත් තැපෑලෙන් (Email) යොමු කළ යුතුය. ඒ අනුව පුරප්පාඩු ඇත්නම්/සුහද මාරුවීම් ඇත්නම් ඔබේ ඉලල්ලීමට අවසර ලැබෙන අතර ඒ පිළිබඳව දුරකතනයෙන් ඔබව දැනුවත් කරනු ඇත.

**1.4.**

පීඨවලට ඇතුලත් කිරීම සඳහා උසස් පෙළ හැදෑරූ විෂයයන් සලකා බැලුව ද පීඨ දෙක විසින් ඉදිරිපත් කොට ඇති උපාධි පඨමාලා 46 න් විශ්වවිද්‍යාල අධ්‍යයනයේ දී උසස් පෙළ අදාල විෂයයන් සමත්වීම සුදුසුකමක් ලෙස සලකන්නේ ප්‍රංශ/ඉංග්‍රීසි/ජපන්/භූගෝල විද්‍යාව යන විෂයයන් පමණි. උසස් පෙළ සමත් නොවූවත් අධ්‍යයන අංශය මගින් පවත්වන යෝග්‍යතා පරීක්ෂයෙන් සමත්වීම ජපන් භාෂාව හා භාෂා පරිවර්තන ක්‍රම යන විෂයයන් හැදෑරීම සඳහා සුදුසුකම් සේ සැලකේ. සමාජ සංඛ්‍යානය හැදෑරීම සඳහා අපොස සාමාන්‍ය පෙළ විභාගයේ දී ගණිත විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුවේ.

අනිත් සියලු විෂයයන් හැදෑරීම සඳහා පූර්ව අවශ්‍යතා නොමැති බැවින් තමාගේ රුචිකත්ව හා හැකියාව මත විෂයය තොරා ගැනීමේ නිදහස විද්‍යාර්ථියාට ලබා දී ඇත.

**<u>අධ්‍යයන ලියාපදිංචිය සම්බන්ධ විශේෂ උපදෙස්</u>**

**2. ඉල්ලුම් පත්‍රය (අධ්‍යයන ලියා පදිංචිය සඳහා)**

දෙවන අදියරේ දි මානවශාස්ත්‍ර හා සමාජයයී විද්‍යා පීඨයට තොරාගත් සිසුන් කණ්ඩායම් දෙකක් ලෙස අන්තර්පීඨ විෂයමාලා සම්බනධීකරණ මධ්‍යසථානයේ ***iccms*** ලියා පදිංචි කරන අතර ඉන් පසු සියලු විද්‍යාර්ථීන් ***iccms*** වෙබ් පිටුවේ ඇති තම පෞද්ගලික ගිණුමට පිවිස සුදුසුකුම් අනුව තමන් කැමති විෂය තුනක් ඉහත උපදෙස් අනවු පීඨය වෙනස් නොවන පරිදි එක් විෂයය කණ්ඩයකින් එකක් වන පරිදි තෝරාගෙන තම අධ්‍යයන ලියා පදිංචිය සිදු කර ගත යුතුය.

ඔබට අවශ්‍ය නම් මෙහි දී පීඨ බෙදා ගැනීමේ දී ඉල්ලුම් කළ විෂයයන් වෙනුවට වෙනත් විෂයයන් තුනක් තෝරා ගැනීමේ හැකියාව ඇති අතර එය ද පීඨය වෙනස් නොවන පරිදි සිදු කළ යුතුය.

පීඨ දෙක සඳහා පොදු විෂය කාණ්ඩ ක්‍රමයක් ක්‍රියාත්මක වේ. මෙය පදනම් කරගෙන දේශන පැය වෙන් කිරීම හා විභාග කලසටහන් සකස් කිරීම සිදු කරන බැවින් **එක් කාණ්ඩයකින් පීඨ දෙකෙන්ම තෝරා ගත හැක්කේ එක් විෂයයක් පමණි.**

| **Subject Group** | **FACULTY OF HUMANITIES**<br>**මානවශාස්ත්‍ර පීඨය** | **FACULTY OF SOCIAL SCIENCES**<br>**සමජයීය විද්‍යා පීඨය** |
|---|---|---|
| **1** | BUCU/HIND | ANTH/SOST/TCRM |
| **2** | FREN/PALI/PADN/PAMU/VIAD/SPNS | GEOG |
| **3** | CHCU/KORE/LTCR | ARCH/POLS |
| **4** | IMAT/LING /HIDM | HIST/PHIL |
| **5** | BUPH/CHIN/GERM/WCCU | ECON |
| **6** | RUSS/SANS/BUPS/JPNS | INTS/LISC/PSYC |
| **7** | TRMD/EDUC | DVST |
| **8** | SINH | |
| **9** | ENGL/VAST | MACO/PRMM |
| **10** | DMAT/TASL/COST | SRMG/COST/ SOCI |

විෂය කාණ්ඩ 10 යටතේ ඇති පරිගණක අධ්‍යයන පාඨමාලාව **COST** විද්‍යා පීඨයෙන් ඉදිරිපත් කරන අතර එම පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන්නේ නම් දී ඇති උපදෙස් අනවු සාමන්‍ය ක්‍රමයට විෂයයන් තුනකට ලියා පදිංචි වී පරිගණක අධ්‍යයනය සඳහා වෙනම ඉල්ලීමක් කළ යුතුය. එය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන අතර සුදුසුකම් අනුව තෝරා ගැනීම් එම අධ්‍යයන අංශය මඟින් සිදු කරනු ලබයි. පරිගණක විෂය හැදෑරීම සඳහා ඔබව තේරී ඇත්නම් තමන්ගේ පීඨය වෙනස් නොවන පරිදි ඉහත ලියා පදිංචි වූ විෂයය තුනෙන් එකක් ඉවත් කළ යුතු වේ.

**විෂය තේරීම සඳහා උදාහරණ**

| | මානවශාස්ත්‍ර පීඨ විද්‍යාර්ථීන් | සමජයීය විද්‍යා පීඨ විද්‍යාර්ථීන් |
|---|---|---|
| 1 | BUCU / PALI / SINH | TCRM / HIST / MACO |
| 2 | BUCU / PALI / **INTS** | TCRM / HIST / **SINH** |
| 3 | BUCU / PALI / **COST** | TCRM / HIST / **COST** |

**3. පීඨ දෙකට අයත් පාඨමාලා ක්ෂේත්‍රයන්ට අදාළ විෂයයන්**

| විෂය කාණ්ඩය | මානවශාස්ත්‍ර පීඨය | සමාජයීය විද්‍යා පීඨය |
|---|---|---|
| 1 | BUCU - Buddhist Culture<br>(බෞද්ධ සංස්කෘතිය)<br>HIND - Hindi<br>(හින්දි) | ANTH - Anthropology (මානව විද්‍යාව)<br>SOST - Social Statistics<br>(සමාජ සංඛ්‍යානය)<br>TCRM - Tourism and Cultural Resource Management<br>(සංචරණය හා සම්පත් කළමනාකරණය) |

| | | |
|---|---|---|
| 2 | FREN - French (ප්‍රංශ)<br>PALI - Pali (පාලි)<br>PADN- Performing Arts Dancing<br>( ප්‍රාසංගික කලා නර්තනය)<br>PAMU- Performing Arts Music<br>(ප්‍රාසංගකි කලා සංගතීය)<br>VIAD - Visual Arts and Design<br>(දෘෂ්‍ය කලා හා සැලසුම් කරණය)<br>SPNS - Spanish (ස්පාඤ්ඤ) | GEOG - Geography<br>(භූගෝල විද්‍යාව) |
| 3 | CHCU - Christian Culture<br>(ක්‍රිස්තියානි සංස්කෘතිය)<br>KORE - Korean (කොරියන්)<br>LTCR - Literary Criticism (සාහිත්‍ය විචාරය) | ARCH - Archaeology<br>(පුරාවිද්‍යාව)<br>POLS - Political Science<br>(දේශපාලන විද්‍යාව) |
| 4 | IMAT- Image Arts (ප්‍රතිබිම්බ කලා)<br>LING - Linguistics (වාග්විද්‍යාව)<br>HIDM - Hinduism (හින්දු ආගම) | PHIL- Philosophy<br>(දර්ශනය)<br>HIST - History (ඉතිහාසය) |
| 5 | BUPH - Buddhist Philosophy<br>(බෞද්ධ දර්ශනය)<br>CHIN - Chinese (චීන)<br>GERM - German (ජර්මන්)<br>WCCU - Western Classical Culture<br>(බටහිර සම්භාව්‍ය සංස්කෘතිය) | ECON - Economics<br>(ආර්ථික විද්‍යාව) |
| 6 | RUSS - Russian (රුසියන්)<br>SANS - Sanskrit (සංස්කෘත)<br>BUPS - Buddhist Psychology<br>(බෞද්ධ මනෝවිද්‍යාව)<br>JPNS - Japanese (ජපන්) | INTS - International Studies<br>(ජාත්‍යන්තර අධ්‍යයනය)<br>LISC - Library and Information Science<br>(පුස්තකාල හා විඥාපන විද්‍යාව<br>PSYC - Psychology (මනෝවිද්‍යාව) |
| 7 | TRMD - Translation Methods<br>(භාෂා පරිවර්තන ක්‍රම)<br>EDUC - Education (අධ්‍යාපන වේදය) | DVST - Development Studies<br>(සංවර්ධන අධ්‍යයනය) |
| 8 | SINH - Sinhala ^isxy,& | |
| 9 | ENGL - English<br>(ඉංග්‍රීසි)<br>VAST - Vastuvidya<br>(වාස්තු විද්‍යාව) | MACO - Mass Communication<br>(ජනසංනිවේදනය)<br>PRMM - Public Relations and Media Management<br>(මහජන සම්බන්ධතා හා මාධ්‍ය කළමනාකරණය) |
| 10 | DMAT - Drama and Theatre<br>(නාට්‍ය හා රංග කලා)<br>TASL - Tamil as a Second Language<br>(දෙවන භාෂාවක් ලෙස දෙමල)<br>COST - Computer Studies<br>(පරිගණක අධ්‍යයනය) | SRMG - Sport and Recreation Management<br>(ක්‍රීඩා හා විශ්‍රාන්ති කළමනාකරණය)<br>COST - Computer Studies<br>(පරිගණක අධ්‍යයනය)<br>SOCI - Sociology (සමාජ විද්‍යාව) |

4. නිශ්චිත පාඨමාලා වන සිනමා හා රූපවාහිනී/පරිවර්තන අධ්‍යයනය/දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම මානවශාස්ත්‍ර පීඨ යටතේ සාමය හා ගැටුම් නිරාකරණය සමාජවිද්‍යා පීඨය යටතේ අයත් වන බැවින් එම විද්‍යාර්ථීන් අධ්‍යයන ලියා පදිංචිය පමණක් සිදුකරගත යුතු වේ.

5. විශෙෂ් ප්‍රවේශී පාඨමාලා ඒකක මානවශාස්ත්‍ර පීඨයට අයත් වේ. එබැවින් එම විද්‍යාර්ථීන් නම් කරන ලද විෂය/ විෂයයන් ඇතුලත් වන පරිදි මානවශාස්ත්‍ර පීඨයෙන් විෂයයන් දෙකකට හෝ තුනකට ලියා පදිංචි විය යුතු අතර අවශ්‍ය නම් එක් විෂයක් අනෙක් පීඨයෙන් ද තෝරා ගත හැකි වේ.

6. DELT 11212 English for Social Sciences සමජයයී විද්‍යා පීඨයේ විද්‍යාර්ථීන්ටත් DELT 12252 English for Humanities මානවශාස්ත්‍ර පීඨයේ විද්‍යාර්ථීන්ටත් අනිවාර්ය වන අතර එම පාඨමාලා ඒකක ලියා පදිංචි කරීම ***iccms*** මගින් සිදු කරනු ලැබේ.

Version 1 Copyright - Ven. Dr. Dammadassi Thero, Former Director, ICCMS, University of Kelaniya